# 8

# ජුමුආ සලාතය

එකිනෙක සමාජයන්ට එක් දිනයක් සුවිශේෂ වූ දින ලෙස ප්‍රකාශිත ය. නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ට හා එතුමාගේ අනුගාමිකයින්ට අල්ලාහ් විසින් ලබා දෙන ලද විශේෂිත දිනය යවුමුල් ජුමුආ යන සිකුරාද දිනයයි. මෙම දිනයේ වූ විශේෂත්වය දැනගෙන නැමඳුම්වලත්, කුසල් ලබා දෙන ක්‍රියාවලත් නිරතවීම මුස්ලිම්වරුන් වන අපගේ වගකීම වේ.

සිකුරාද දිනෙහි පැවැත්වෙන සුවිශේෂ අමලය (යහක්‍රියාව) ජුමුආ සලාතය වේ.

ජුම්ආවේ වැදගත්කම පිළිබඳව අල්කුර්ආනය පහත සඳහන් අයුරු පවසන්නේ ය.

**“ඊමාන්ධාරීනි, ජුම්ආ දිනයේ සලාතය සඳහා කැඳවන ලද්දේ නම්, අල්ලාහ් දික්ර් කිරීම සඳහා (ඉක්මනින්) යන්න. (රැකියාවන්) වෙළෙඳාම අත්හරින්න. එය ඔබට යහපත් වේ. (මෙසේ) ඔබ දැන සිටින්නේ නම් යහපත් ය.” (62 : 09)**

සිකුරාද දිනයේ විශේෂත්වය පිළිබඳව නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණෝ මෙසේ පවසා ඇත්තාහ.

“ඔබට විශේෂිත වූ දිනය සිකුරාද දිනයයි. එම දිනයේ නබි ආදම් අලෙයිහිස්සලාම් තුමා මවන ලද්දේ ය. එම දිනයේ දී එතුමාණෝ මරණයට පත් වූහ. එදින ම අවසාන දිනය ද පැමිණෙයි. එම දිනයේ ම මිනිසා නැවත විභාග කිරීම සඳහා නැගිටුවනු ලබන්නේ ය.”



මෙම දිනයේ අධික වශයෙන් මා කෙරෙහි සලවාත් පවසන්න. නියත වශයෙන් ම ඔබ පවසන සලවාත් මා වෙත පෙන්වනු ලබයි. නබිවරුන්ගේ ශරීරය භූමිය අනුභව කිරීමෙන් (විනාශ කිරීම) අල්ලාහ් හරාම් කොට ඇත. (අහ්මද්)

## ජුමුආ දිනයේ පිළිපැදිය යුතුවන්

සිකුරාද ජුමුආ සලාතය සඳහා දත් මැද, දිය නෑම වැදගත් සුන්නතයකි. මස්ජිදයට යන විට හිසට තෙල් ගා, සුවඳ විලවුන් ගල්වා, ලස්සන ඇඳුමෙන් සැරසී සිටීම විශේෂිත ය. මස්ජිදයේ සිටින මිනිසුන් අභිබවා නොයා තමාට හැකි පමණින් සලාත් කර නිශ්ශබ්දව වාඩි වී **කතීබ්** පවසන දේවල්වලට සවන් දිය යුතු ය. ඉන්පසු ඉමාම් සමඟ සලාතය ඉටු කළ යුතු ය. මෙලෙස ක්‍රියාකරන්නාගේ ඉකුත් සිකුරාද දිනයේ සිට මෙම සිකුරාද දිනය දක්වා කාලය තුල කරන ලද සුළු පව්වලට සමාව ලැබෙන බව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පවසා ඇත.

ජුමුආ දිනයේ සූරතුල් කහ්ෆ් (18වන) සූරතය පාරායනය කිරීම මගින් ඊළඟ ජුමුආ දිනය දක්වා සිතේ ප්‍රබෝධයක් ඇති කරවයි. ඒ සමඟ ම සිකුරාද දවස්වල නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් වෙත අධික ලෙස සලවාත් පැවසීම ද ශ්‍රේෂ්ඨ ගුණාංගයකි.



"ජුමුආ දිනයේ එක්තරා වේලාවක් තිබේ. එම වේලාව කෙටි වෙලාවකි. එම වෙලාවේ මුස්ලිම්වරයෙකු සලාතයේ නිරත වී අල්ලාහ්ගෙන් යමක් ඉල්ලූ විට එය ඔහුට අල්ලාහ් නොදී සිටින්නේ නැත," යැයි නබි වදනෙහි කියැවේ.

ජුම්ආ සලාතය යනු සිකුරාද දිනයේ ලුහර් සලාතය වෙනුවට ඉමාම් මිම්බරයේ පවත්වන කුත්බා දේශනයෙන් පසුව ඉටු කරන රක්ආත් දෙකක සලාතය වේ. මෙම සලාතය මුස්ලිම්වරුන් සියලුදෙනාට ම අනිවාර්ය වගකීමක් වේ. මෙමගින් සෑම මුස්ලිම්වරයෙකු ම සතියකට වරක් ආගමික උපදේශයන්ට සවන් දී, ඉගෙන ගන්නා අතර ගමේ අනෙකුත් මහල්ලාවලට අයත් සහෝදර මුස්ලිම්වරුන් සමග එක් තැනක දී මුණගැසීමේ අවස්ථාව ද සතිපතා ජුමුආවට පෙර කාලයේ පොදු වූ හා වැදගත් වූ කාරණාවන් ගැන සාකච්ඡා කිරීම, අත්‍යවශ්‍ය නිවේදන, දැන්වීම් පළකිරීම යනාදී නොයෙකුත් අවස්ථාවන් ලැබෙන්නේ ය.

මෙම සලාතයටත් මෙම සලාතය ඉටු කරන දිනය වන සිකුරාද දිනයටත් අල්ලාහ්තආලා නොයෙකුත් විශේෂතාවයන් දී ඇත්තේ ය.

## ජුමුආවට වේලාසනින් පැමිණීම

ජුමුආ දිනය පැමිණිවිට දේව දූතයෝ මස්ජිදයේ දෙරකඩ දෙසින් සිටගෙන පළමුව පැමිණෙන්නා, ඉන්පසු නොකඩවා පැමිණෙන අය ද (වාර්තා) ලේඛනගත කරගන්නෝ ය. පළමුවෙන් පැමිණෙන්නා ඔටුවෙකු ද, ඉන්පසු පැමිණෙන්නා හරකෙකු ද, ඊළඟට පැමිණෙන අය ද එළුවෙකු ද කුර්බාන් දුන් අය හා සමාන ලෙස සැලකේ. ඉන්පසු පැමිණෙන්නන් කුකුළෙකු ද, ඊළඟ පැමිණෙන්නා බිත්තරයක් ද දන් දුන් අය ලෙස සලකනු ලැබේ. ඉමාම් මිම්බරයට නැඟීමෙන් පසු දේව දූතයෝ තමන්ගේ (වාර්තා) ලේඛන පොත් වසා දමා කුත්බා දේශනාව ඇසීමට යති," යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පවසා ඇත්තාහ. (බුහාරි)

සිකුරාද මස්ජිදයට පැමිණෙන මලාඉකාවරුන්ගේ වාර්තා පොතේ අපගේ නම් ලියවා ගැනීමට උවමනාවේ නම් අප ඉමාම් මිම්බරයට නැඟීමට ප්‍රථමයෙන් ම මස්ජිදයට යා යුතු ය. ජුමුආ සලාතයට මස්ජිදයට පැමිණෙන අය ඉමාම් දේශනය පවත්වමින් සිටිය ද, ජුමුආ සලාතයට පෙර කෙටියෙන් රක්ආත් දෙකක් "**තහියියතුල් මස්ජිද්**" සලාතය ඉටු කළ යුතු ය.

"කවරෙක් දිය නා කලින් ම (මස්ජිදයට) පැමිණ, ඉමාම්වරයාට ළංව සිට ඔහුගේ දේශනයට සවන් දී ජුමුආව නාස්ති නොකර සිටින්නේ ද ඔහුට ඔහු තබන සෑම පියවරකට ම වසරක් උපවාසයේ යෙදී, වසරක් සිටගෙන නැමඳුම් කළ කුලිය ලැබේ," (තිර්මිදි) යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පැවසූහ.

නියමිත වයසට නොපැමිණි අය, කාන්තාවන්, රෝගීන් හා මගීන් යනාදී හු ජුමුආ සලාතය වගකීමක් නොවන අය වෙති.

ජුමුආහි ඉමාම් දේශනාව පවත්වන විට ඔහුගේ දේශනය අසා සිටින්නවුන් අතර කතා කිරීම සම්පූර්ණයෙන් ම තහනම් කර ඇති ක්‍රියාවකි.

කතා කරමින් සිටින්නෙකු අමතා "නිශ්ශබ්ද වන්න" යැයි කීමෙන් ද දෙදෙනාගේ ම පින් නැති වී යා හැකි බවට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් අවවාද කර ඇත.

ජුමුආ සලාතයේත්, සිකුරාද දිනයේත් විශේෂත්වය හා ප්‍රයෝජන ගැන පවසන ඉස්ලාම් දහම, ජුමුආ සලාතය නොසලකා හරින්නන්ට අවවාද කර ඇත. එනම්, නොසැලකිල්ලෙන් කවරෙකු ජුමුආ 3ක් මගහරී ද ඔහුගේ සිතෙහි අල්ලාහ් මුද්‍රා තබන බව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පවසා ඇත්තාහ. (තිර්මිදි)

එසේ ම, 'ජුමුආවට නොගොස් නිවසෙහි රැඳී සිටින්නන්, ඔහුගේ නිවසත් සමඟ ම ගිනිතබා විනාශ කර දමන්නට මට සිතේ,' යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පවසා තිබීමෙන් ජුමුආවේ වැදගත්කම තවදුරටත් තහවුරු කරන්නේ ය.

**එනිසා ජුමුආවේ විශේෂත්වයත් එය අත්හැරීමෙන් අත් වන විපත්තියත් සැලකිල්ලට ගෙන ජුමුආ සලාතය නොවරදවා ඉටු කරමු! ජුමුආ සලාතයට පෙර පවත්වන කුත්බා දේශනය නොවරදවා මුළුමනින් ම සවන් දී එම දිනයේ ප්‍රයෝජනයත් මුළුමනින් ම ලබා ගනිමු.**

**අභ්‍යාසය**

01. ජුමුආ සලාතයට රකාඅත් කීයක් තිබේ ද?

02. සිකුරාද දිනයේ විශේෂත්වයන් දෙකක් ලියන්න.

03. ජුමුආ දිනයේ ඉටු කළ යුතුවන් පිළිවෙත් මොනවා ද?

04. ජුමුආ සලාතය මඟින් සම්පූර්ණ කුසල් ලබා ගැනීමට අප කළ යුතු යන ක්‍රියාවන් පහක් ලියා දක්වන්න.

05. ජුමුආ හි කුත්බාවට සවන් දීමෙන් ලැබෙන ආනිශංස හා එය නොසලකා හැරීමෙන් සිදුවන විපාක දක්වන්න.